# ශ්‍රී ලංකාවේ සංඝාධිකරණවල ඉතිහාසය, එහි නෛතික රාමුව සහ නව ප්‍රවණතා

නීතිඥ ඩී. සුපුන් රෂින්ද ජයවර්ධන

## ප්‍රවේශය

බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන වදාළ ධර්මය අනුගමනය කරන ගිහි පැවිදි පිරිස පොදුවේ 'සංඝ' යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 'භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා' යන සිව්වනක් පිරිසෙන් සැදුම්ලද්දකි. මෙයින් භික්ෂුන් වහන්සේ සහ භික්ෂුණීන් වහන්සේ පැවිදි පාර්ශ්වය නියෝජනය කරන අතර උපාසක උපාසිකා දෙපක්ෂය සැලකෙන්නේ ගිහියන් වශයෙනි. මෙසේ සිව්වනක් පිරිස බුදු සසුනේ කටයුතු පවත්වාගෙන යන අතරතුර එක් එක් පාර්ශ්වයන් අතර විවිධ කරුණු අරභයා අර්බුද පැනනැගීම ස්වභාවයෙන් ම සිදුවන්නකි. එහි දී ඇතැම් අර්බුද සාකච්ඡා මාර්ගයෙන් විසඳාගත හැකි වූව ද ඇතැම් අර්බුද විසඳා ගැනීම උදෙසා අධිකරණමය ක්‍රියාමාර්ග වෙත යොමු වීමට සිදු වේ. මෙසේ නිර්මාණය වන ගැටලු ආකාර ත්‍රිත්වයකට පොදුවේ වර්ග කළ හැකි ය.

1. භික්ෂූන් වහන්සේ දෙනමක් හෝ පැවිදි දෙපාර්ශවයක් අතර ඇතිවන ගැටලු
2. ගිහි පුද්ගලයෙකු සහ එක් භික්ෂුවක් අතර හෝ ගිහි-පැවිදි දෙපාර්ශ්වයක් අතර ඇතිවන ගැටලු
3. ගිහි පුද්ගලයන් දෙදෙනෙකු අතර හෝ ගිහි දෙපාර්ශ්වයක් අතර ඇතිවන ගැටලු

මෙයින් දෙවන සහ තුන්වන කාණ්ඩයන්ට අයත් ගැටලු සඳහා රටෙහි සාමාන්‍ය අධිකරණ ක්‍රියාවලිය අදාළ වේ. එසේ

වුව ද භික්ෂූන් වහන්සේ දෙනමක් හෝ පැවිදි පාර්ශ්වයන් දෙකක් අතර ඇතිවන ගැටලු සඳහා රටෙහි සාමාන්‍ය නීතිය එක හෙලාම අනුකූල කරගැනීම අපහසු ය. එසේ ම එවැනි ගැටලුවක් රටෙහි ප්‍රාථමික අධිකරණයක් වෙත මුලින් ම යොමු කිරීමට වඩා එය මුල් අවස්ථාවේ දී ම භික්ෂු ශාසනය තුළ ම විසඳා ගැනීමට කටයුතු කිරීම වඩාත් ප්‍රායෝගික බව පෙනී යයි. මෙකී තත්ත්වයන්ට පිළියමක් ලෙස බුදුරජාණන් වහන්සේ විසින් ම අනුදැන වදාළ අධිකණමය ක්‍රියාවලියක් ලෙස සංඝාධිකරණය ස්ථාපනය කිරීම පෙන්වා දිය හැකි ය. මෙම ලිපිය,

1. ශ්‍රී ලංකාවේ බෞද්ධ ශාසනික නීති ක්‍රම සහ සංඝාධිකරණවල ඉතිහාසය,
2. සංඝාධිකරණයක් බලාත්මක කිරීමේ දී අනුගමනය කළ යුතු නීතියේ පොදු මූලධර්ම,
3. වරින්වර ශ්‍රී ලංකාවේ සිවිල් (ගිහි) අධිකරණ විසින් සංඝාධිකරණවලට අදාළ කටයුතු අර්ථනිරූපණය කර ඇති ආකාරය සහ
4. නූතනයේ කරලියට පැමිණ තිබෙන 'ථෙරවාද භික්ෂු කතිකාවත් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත' ආශ්‍රිත ව ගොඩනැගී ඇති නව ප්‍රවණතා

යන ශීර්ෂයන්ට යටත් ව විධිමත් සාකච්ඡාවක් ගොඩනැගීමට අදහස් කරයි.

### 1. ශ්‍රී ලංකාවේ බෞද්ධ ශාසනික නීති ක්‍රම සහ සංඝාධිකරණවල ඉතිහාසය

කිතුල්ගොඩ ආරණ්‍ය සේනාසනය විසින් සිංහල අනුවාද සහිත ව සම්පාදිත 'භික්ෂු ප්‍රාතිමෝක්ෂය සහ විනය කරුණු' යන ග්‍රන්ථයේ සරල බසින් දක්වා ඇති බුදුරජාණන් වහන්සේ සහ සාරිපුත්ත මහරහතන් වහන්සේ අතර සංවාදය වෙත අවධානය යොමු කිරීම මෙහි දී ඉතා වැදගත් වේ.[1] ඒ අනුව 'බුදුරජාණන් වහන්සේ වේරංජා නුවර වැඩවාසය කරන කල්හි, සාරිපුත්ත මහරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ විමසා

සිටියේ භාග්‍යවතුන් වහන්ස, කුමන බුදුරජාණන් වහන්සේලාගේ ශාසනය චිරස්ථායී වී ද? යනුවෙනි. මීට ''කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙන භගවතො ච විපස්සිස්ස භගවතො ච සිඛිස්ස භගවතො ච වෙස්සභුස්ස බ්‍රහ්මචරියං න චිරට්ඨිතිකං අහොසීති' යනුවෙන් බුදුරජාණන් වහන්සේ පිළිතුරු දුන් සේක. එහි අර්ථය වන්නේ මෙයින් පෙර පහළ වූ විපස්සි, සිඛී, වෙස්සභූ බුදුරජාණන් වහන්සේලාගේ ශාසන බොහෝ කල් නොපැවතුණ අතර කකුසඳ, කෝණාගම, කාශ්‍යප බුදුරජාණන් වහන්සේලාගේ ශාසන බොහෝකල් පැවතුණ බව ය. සාරිපුත්ත මහරහතන් වහන්සේ එසේ වීමට හේතු විමසූ කල්හි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ : ''භගවා ච සාරිපුත්ත විපස්සි භගවා ච සිඛී බගවා ච වෙස්සභූ කිලාසුනො අහෙසුං සාවකානං විත්ථාරෙන ධම්මංදෙසෙතුං, අප්පකං ච තෙසං අහොසි සුත්තං, ගෙය්‍යං, වෙය්‍යාකරණං, ගාථා, උදානං, ඉත්තිවුත්තකං, ජාතකං, අබ්භූතධම්මං, වේදල්ලං, අප්පඤ්ඤතං සාවකානං සික්ඛාපදං අනුද්දිට්ඨං පාතිමොක්ඛං'' යනුවෙනි. එනම් සාරිපුත්තය, විපස්සි, සිඛී, වෙස්සභූ සම්මා සමුබුදුරජාණන් වහන්සේලා විසින් තම ශ්‍රාවකයින් හට නවාංග ශාස්තෘ ශාසනය විස්තර වශයෙන් දේශනා නොකළ අතර, ආණා ප්‍රාතිමෝක්ෂය නොදෙසන ලදි. ශික්ෂාපද නොපනවන ලදි. එබැවින් එම බුදුරජාණන් වහන්සේලාගේ ශාසන ඉතාම ඉක්මනින් අතුරුදන් විය. සාරිපුත්ත, කකුසඳ, කෝණාගම, කාශ්‍යප යන සම්මා සම්බුදුරජාණන් වහන්සේලා විසින් තම ශ්‍රාවකයන් හට නවාංග ශාස්තෘ ශාසනය විස්තර වශයෙන් දේශනා කළ අතර ආනා ප්‍රාතිමෝක්ෂය දෙසන ලදි. ශික්ෂාපද මනා කොට පැනවූ බැවින් එම බුදුරජාණන් වහන්සේලාගේ ශාසන බොහෝ කල් පැවතුණ බව දේශනා කළ සේක''.

ඉහත කාරණය අපට ඉතා ම පැහැදිලිව පෙන්වා දෙන්නේ ශාසනය යනු සීල, සමාධි, ප්‍රඥා යන ආර්යය මාර්ගය බවත් එම උතුම් මාර්ගය අවබෝධ කිරීමට බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ විනය, සූත්‍ර, අභිධර්මය නොනැසී පැවතිය යුතු අතර එයින් ප්‍රධාන වශයෙන් බුදුරජාණන් වහන්සේලා විසින් දේශනා කළ උතුම් ආණා ප්‍රාතිමෝක්ෂය ආරක්ෂා කළ යුතු බවත් ය.

ඒ අනුව සද්ධර්මය තුළ සම්බුද්ධ ශාසනය ප්‍රධාන අංග ත්‍රිත්වයකින් සංයුක්ත වන බවට විග්‍රහ කරයි. එනම්, පරියත්ති ශාසනය, ප්‍රතිපත්ති ශාසනය සහ ප්‍රතිවේධ ශාසනය යනුවෙනි.

මෙහි දී පරියත්ති ශාසනය යනුවෙන් හඳුන්වනු ලබන්නේ විනය, සූත්‍ර, අභිධර්මය යන සද්ධර්මය මිත්‍යාදෘෂ්ඨික ප්‍රතිපත්ති ආදියෙන් කිලිටි නොවී බුදුරජාණන් වහන්සෙ විසින් දේශිත ස්වභාවයෙන් ම මුල, මැද, අග සර්වාකාරයෙන් දේශිත ශ්‍රී සද්ධර්මය පැවතීම යි[2]. එමෙන් ම සීල, සමාධි, ප්‍රඥා නැමති ආර්ය මාර්ගය ලෞකික-ලෝකෝත්තර වශයෙන් වැඩීම ප්‍රතිපත්ති ශාසනය යනුවෙන් හැඳින්වෙන අතර[3] ප්‍රතිවේධ ශාසනය යනුවෙන් විග්‍රහ වනුයේ එකී ආර්ය මාර්ගය පරිපූර්ණ කරමින් ලබන සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන සතර මාර්ගඵල ලබාගැනීම4 යි.

ඉහත කෙටියෙන් විග්‍රහ කරන ලද සම්බුද්ධ ශාසනය නිසිපරිදි ආරක්ෂා වීමට නම් ශාසන විනය ආරක්ෂා වීම අතිශය වැදගත් වේ. ඒ අනුව බුදුරජාණන් වහන්සේ විවිධ කරුණු අරබයා භික්ෂු සීලයට අදාළව ශික්ෂාපද නවදහස් එකසිය අනූ කෝටි පනස් ලක්ෂ තිස් හයදහසක් පෙන්වා දී ඇත. එය විනය පිටකට යනුවෙන් හඳුන්වන අතර ධර්මස්කන්ධ වශයෙන් විසි එක් දහසකි. මෙම විනය පිටකය[5] පාරාජිකා පාළිය, පාචිත්ති පාළිය, මහාවග්ග පාළිය, චුල්ලවග්ග පාළිය, පරිවාර පාළිය යනුවෙන් ග්‍රන්ථ පහක් වශයෙන් ප්‍රථම ධර්ම සංඝායනාවේ දී වෙන්කරන ලදි.[6]

කෙසේ වූව ද බෙන්ජමින් ස්කොන්තල් සහ අසංග වැලිකල යන විද්වතුන් පෙන්වා දෙන්නේ බුදුදහම ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වීමේ දී එය රාජ්‍ය පාලන මූලධර්ම සමඟ මුසු වී ඇති බවයි.[7] එය සිංහල සහ හින්දු සිරිත් විරිත් ද උකහාගත් නව බෞද්ධ සම්ප්‍රදායක් මෙරට තුළ ගොඩනැගීම පිණිස හේතු වී තිබේ. වසර 1769 දී රචිත 'ලක් රජ ලෝසිරිත'[8] නම් ග්‍රන්ථය උපුටා දක්වමින් ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා ශ්‍රී ලාංකේය සමාජය තුළ බුදුදහම ස්ථාපිත වී ඇති ආකාරය සම්බන්ධ ව සිදු කරන නිරීක්ෂණයන් මෙහි දී ඉතාමත් වැදගත් ය.

ඒ අනුව :

1. ශ්‍රී ලාංකේය නීතිය බුදුදහම හැර වෙනත් කිසිදු ආගමක් ප්‍රමුඛත්වයෙහි ලා නොසැලකීම
2. සිල්වත් භික්ෂූන් වහන්සේට මරණ දඬුවමින් දඬුවම් නොකිරීම
3. බුදුරජාණන් වහන්සේගේ ධාතූන් හෝ බුද්ධ ප්‍රතිමා ඇතුළත් වෙහෙර, විහාර, පන්සල් සහ බෝධි විනාශ වීමට ඉඩ ලබා නොදීම සහ ඒවා වැඩිදියුණු කර ආරක්ෂා කිරීම
4. ශ්‍රී ලංකාවේ රජතුමා කිසි විටකත් බුදුදහම හැරුණු විට වෙනත් ආගමක් සරණ නොයෑම

යන චාරිත්‍ර මෙරට නීතිය තුළ මුල්බැසගෙන තිබූ බව එතුමා පෙන්වා දෙයි.[9] මීට සමාන්තර අදහසක් පල කරමින් මහාචාර්ය තම්බයියා කියා සිටින්නේ දේවානම් පියතිස්ස රජ සමයේ දී බුදුදහම ලක්දිවට පැමිණීමත් සමග විශාල පිරිසක් බුදුදහම වැළඳගැනීම සිදු වූ බව යි. තව ද එකී පිරිසට අරිට්ඨ කුමරු ඇතුළු රාජකීයයන් විශාල ප්‍රමාණයක් අයත් වීම තුළ බුදුදහම නිතැතින් ම රාජ්‍ය ආගම බවට පත්විය.[10]

පසු කාලීනව බුදු සසුන අභ්‍යන්තරික වශයෙන් හෝ බාහිර වශයෙන් පසුබෑමට ලක් වූ අවස්ථාවල ශ්‍රද්ධා බුද්ධි සම්පන්න රජවරුන් සිල්වත්, ගුණවත් මහ තෙරවරුන්ගේ මූලිකත්වයෙන් ධර්ම විනය යළි නගා සිටුවීම සඳහා ද මතු එබඳු පසුබෑමක් ඇති නොවීම සඳහා ද නීතිරීති සම්පාදනය කරන ලදි.[11] එසේ සම්පාදිත ව්‍යවස්ථාවන් කතිකාවත් ලෙස හඳුන්වන අතර පොළොන්නරු යුගයේ සිට මහනුවර යුගය අවසානය දක්වා එබඳු කතිකාවත් දහයක් පමණ දක්නට ඇත.[12] පොළොන්නරු ගල් විහාර ලිපිය යන අන්වර්ථ නාමයෙන් ද හැඳින්වෙන මහා පරාක්‍රමබාහු කතිකාවතේ ඓතිහාසික සංඥාපනයේ ''තෘතිය ධර්ම සංගායනාව කර වූ ධර්මාශෝක මහා රජහු මෙන් අනේක ශත පාප භික්ෂූන් ශාස්තෘ ශාසනයෙන් අප ගත කොට පූර්ව රාජ්‍යයන් විසින් මහොත්සාහයෙනුදු සමගි නොකොට ගතහුණු

තුන්නිකා සමග කිරීමෙන් එක්නිකා කොට'' යනුවෙන් සඳහන් වෙයි. ඒ අනුව මහා පරාක්‍රමබාහු කතිකාවත සම්පාදනය කිරීමට ප්‍රථම කරුණු දෙකක් ඉටුකළ බව මෙයින් කියැවේ. එනම් පාප භික්ෂූන් සසුනෙන් නෙරපීම සහ තුන් නිකාය සමගි කොට එක් නිකායක් බවට පත් කිරීම යි. චූලවංශයේ එකී පාප භික්ෂූන් විස්තර කෙරෙනුයේ ''කුච්ඡි පූරණ කිච්චහි අලජ්ජීහි පුත්තදාරාදි පොසනං'' උදර පෝෂණය පරමාර්ථය කොටගත් ලජ්ජා නැති අඹුදරුවන් රකින භික්ෂූ වේශයෙන් විසූ තැනැත්තන් යනුවෙනි.[13] ශාසන අභිවෘද්ධිය වෙනුවට සිය පෞද්ගලික අරමුණු උදෙසා මෙකී භික්ෂු වේශයෙන් පෙනීසිටි තැනැත්තන් ක්‍රියා කළ අතර එය භික්ෂු විනය පිරිහීමට ප්‍රබල ලෙස ඉවහල් විය. මේ තත්ත්වය පොළොන්නරු කතිකාවත සහ දඹදෙනි කතිකාවත යන කතිකාවත් ද්විත්වයෙහිම විග්‍රහ කරන්නේ ''ඒ ඒ තැන ප්‍රමාදව වසන ශාසනාවචර බොහෝ පුද්ගලයන්ගේ ශාසන පරිහානිකර වූ අප්‍රතිපත්ති දුස්ප්‍රතිපත්ති බාහුල්‍ය'' යනුවෙනි. මෙහි දී ''අප්‍රතිපත්ති දුස්ප්‍රතිපත්ති බාහුල්‍ය'' නොඑසේ නම් ප්‍රතිපත්තියෙන් බැහැර වූ සහ ප්‍රත්පත්ති විරෝධී යන වචන පැහැදිලි ව යොදා තිබුණ ද 'අප්‍රතිපත්ති' සහ 'දුස්ප්‍රතිපත්ති' යන්නට අර්ථ නිරූපනයක් සපයා නැත. එකී ලුහුඬුතාව පසුකාලීන ව පනවන ලද කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත මගින් සපුරා තිබේ. ඒ අනුව ''බොහෝ දෙන නක්ෂත්‍ර වෛද්‍ය ක්‍රමය යක්ෂප්‍රලය ආදී වූ බුදුන් විසින් එපා කර වදාළ නින්දිත ශාස්ත්‍ර ඉගැන්මෙන් රාජරාජ මහාමාත්‍ය සේවනයෙන් ග්‍රාමකෙෂ්ත්‍රාදී තනතුරු ලබා ගැන්මෙන් ගොවිතැන් වෙළඳාම් ආදී වූ නොයෙක් අකතර්ව්‍යයෙහි යෙදී ඥාති කුල සංගට්ඨව පුත්‍රදාර පෝෂණශීලී ව ශාසන පිළිවෙත් පිරිහී ගොස් විනාශමුඛ ප්‍රාප්තව සිටි කල්හි'' යනුවෙන් නක්ෂත්‍රය, වෛද්‍යක්‍රම, ගුප්ත ශාස්ත්‍රය ආදී වූ ශාස්ත්‍රයන් හැදෑරීම, දේශපාලනය හා ඍජුව සම්බන්ධ වෙමින් ගම් ප්‍රධානී වැනි තනතුරු ලබා ගැනීම, කෘෂිකර්මය, ව්‍යාපාරික කටයුතු වැනි ධන උත්පාදන මාර්ගවල යෙදීම, අඹුදරුවන් පෝෂණය කිරීම ඇතුළු ගෘහාශ්‍රිත කටයුතුවල නිරත වීම, 'අප්‍රතිපත්ති' සහ 'දුස්ප්‍රතිපත්ති' යන්නට අයත් වන බව යි. මේ පිළිබඳ තවදුරටත් විග්‍රහයෙහි යෙදෙන අසිත ගුණසිංහ සඟරජවත නම් ග්‍රන්ථයෙහි එන ''දහම් ලෙස නොහැසිර කුල

දූෂණය කර කර බණ නොඉගෙන පවර නැකැත් වෙදකම් පුරුදු කැර කැර'' යන කවිය උපුටා දක්වමින් පෙන්වා දෙන්නේ එවක ජන සමාජය කොපමණ දේශපාලනික ව පිරිහී තිබුණ ද එවැනි හැසිරීම් බෙහෙවින් හෙළා දකිනු ලැබූ බවයි.[14] ඉහත ශාසනික ප්‍රතිසංස්කරණයන්ට සමාන්තර ව නැවත වරක් ලාංකික භික්ෂූන් වහන්සේ විසින් උපසම්පදා විනය කර්මය පවත්වාගෙන යාම ආරම්භ වූ අතර ඒ උදෙසා වැලිවිට සරණංකර සඟ රජ හිමියන්ගෙන් ලැබුණු දායකත්වය අතිමහත් විය. කෙසේ වුව ද නැවත වරක් රාජාධිරාජසිංහ රජ දවස මල්වතු මහානායක මොරතොට ධම්මක්ඛන්ධ නාහිමියන්ගේ මූලිකත්වයෙන් ශාසනික කතිකාවතක් ද ඇති කිරීමට කටයුතු කළ බව පෙනේ.[15] ඒ අනුව විනය පිටකයෙහි එන ශික්ෂාපදවලට අමතරව මෙරට ස්ථාපිත බුදු සසුන තුළ කතිකාවත් නීතිය ද තීරණාත්මක සාධකයක් වූ බව පෙනී යන්නකි.[16]

## 2. සංඝාධිකරණයක් බලාත්මක කිරීමේ දී අනුගමනය කළ යුතු නීතියේ පොදු මූලධර්ම

නූතන සංඝාධිකරණ ක්‍රියාවලිය සාර්ථකව පවත්වාගෙන යෑම පිණිස උපකාර කරගත හැකි මූලධර්ම ප්‍රධාන මාතෘකා දෙකක් ඔස්සේ විග්‍රහ කළ හැකි ය. එනම්,

I. සංඝාධිකරණයක් සංස්ථාපනය කිරීමට සහ එහි කටයුතු පවත්වාගෙන යාමට අදාළ වන බෞද්ධ ශාසනික මූලධර්ම සහ

II. අධිකරණමය ක්‍රියාවලියක් මෙහෙයවීමට අදාළ ව නූතනයේ භාවිත වන නීතියේ පොදු මූලධර්ම වශයෙනි.

### 2.1 සංඝාධිකරණයක් සංස්ථාපනය කිරීමට සහ එහි කටයුතු පවත්වාගෙන යාමට අදාළ වන බෞද්ධ ශාසනික මූලධර්ම

ඉහත පරිච්ඡේදයේ සාකච්ඡා කළ පරිදි ගිහි දෙපාර්ශ්වයක් අතර ඇතිවන නීතිමය ගැටලු සහ ගිහි හා පැවිදි පාර්ශ්ව දෙකක් අතර ඇතිවන එවැනි ගැටලුවක් විසඳාගැනීමට රටේ පවත්නා

සාමාන්‍ය අධිකරණමය ක්‍රියාවලිය වෙත යොමු විය යුතු ය. මීට අමතරව පැවිදි දෙපාර්ශ්වයක් අතර ඇතිවන අර්බුද සමහරක් සඳහා ද සාමාන්‍ය අධිකරණ ක්‍රියාවලියම අදාළ වේ. නිදසුනක් ලෙස භික්ෂූන් වහන්සේ කෙනෙකු අතින් අපරාධමය වරදක් සිදු වූ විට ඊට එරෙහිව මහෙස්ත්‍රාත් අධිකරණයේ හෝ මහාධිකරණයේ නඩු පවරණ අතර ඉන් අනතුරුව ක්‍රමානුකූලව රටේ අපරාධ නඩු විමසන අධිකරණ ධූරාවලිය ඔස්සේ ඉහළ අධිකරණ වෙත අභියාචනා කිරීම සිදුවේ.[17] එමෙන්ම භික්ෂූන් වහන්සේ දෙනමක් අතර ඇතිවන ණය මුදල් සම්බන්ධ ගැටලුවක දී එය පැවිදි දෙපාර්ශවයක් අතර පවතින සිවිල් ආරවුලක් වන හෙයින් විසඳා ගැනීමට සිදුවන්නේ දිසා අධිකරණය මගිනි.

මීට අමතර ව භික්ෂු විනයට අදාළව බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන වදාළ විනය රීතීන් ඔස්සේ ගොඩනැගෙන ඇතැම් තත්වයන් රටේ පවත්නා සාමාන්‍ය අධිකරණ ක්‍රියාවලියෙන් බැහැරව විසඳාගැනීම වඩාත් යෝග්‍ය වේ. මෙකී අර්බුදයන් අතර ඍජුව ම සිවිල් හෝ අපරාධ ගණයට අයත් නොවන ආරවුල් භික්ෂූන් වහන්සේලා අතර පවතී. විහාරාධිපතිත්ව අනුප්‍රාප්තිය,[18] ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරා ගැටලු,[19] විහාර දේවාල දේපළ පරිහරණය මෙන් ම ගුරු ශිෂ්‍ය සබඳතා පිළිබඳ ගැටලු මේ අතරින් ප්‍රධාන වේ. මීට අමතරව බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ විධිවිධාන අනුව සාමණේර/උපසම්පදා ලියාපදිංචි කිරීම පැහැර හැරීම, භික්ෂු වේශයෙන් කටයුතු කිරීම ආදිය අපරාධමය වරදවල් ලෙස දක්වා තිබේ.

ඉහත සියල්ලටම අමතරව භික්ෂු ජීවිතය අතරතුර ආරක්ෂා කළ යුතු විනය නීතීන් විනය පිටකය තුළ දක්වා තිබේ. මෙහි මූලික විනය නීතීන් 'මූලපඤ්ඤත්ති' ලෙස හඳුන්වනු ලබන අතර ඊට පසුව එක් කෙරුණු කොටස් 'අනුපඤ්ඤත්ති' යනුවෙන් බුදුදහම විග්‍රහ කරනු ලබයි. මෙම දෙවර්ගයටම අයත් විනය නීතීන් 'ශික්ඛාපද' යනුවෙන් හඳුනා ගැනේ. එකී ශික්ෂාපද උල්ලංඝනය වීම් 'ආපත්ති' වශයෙන් හඳුන්වන අතර එවැනි භික්ෂු විනය උල්ලංඝනය කිරීම් සම්බන්ධව ලබා දිය යුතු දඬුවම් සහ එම දඬුවම් සම්බන්ධ සීමාවන් එහිම දක්වා ඇත. මෙය ප්‍රධාන

අවස්ථා හතක් යටතේ මහාචාර්ය කෝලේයි විග්‍රහ කරයි. එම වරදවල් නම්,

1. පාරාජිකා
2. සංඝාදිසේස
3. ථුල්ලච්චය
4. පාචිත්තිය
5. පටිදේසනීය
6. දුක්කට
7. දුබ්භාසිත

මින් පාරාජිකා යන්න බරපතලම වරද ලෙස සැලකෙන අතර එය අප්‍රතිකාරී 'ගරුකාපත්ති' ගණයට ගැනෙන වරදක් ලෙස සැළකේ. ධර්මවේදී නාලන්දේ විමලවංශ හිමි සිය ලිපියෙන් පෙන්වා දෙන අන්දමට එහි දී සාමණේරයන් වහන්සේලාට බලපාන පාරාජිකා දහයක් ඇත. ප්‍රාණඝාතය, අදත්තාදානය, මෛථූන සේවනය, බොරු කීම, මද්‍යපානය, බුදුන් දහම් සඟුන්ගේ අගුණ කීම, මිසඳිටු බව, භික්ෂුණියන් දූෂණය කිරීම යන කරුණු දහය එම පාරාජිකාවෝ වෙති.[20] එමෙන්ම යම් භික්ෂුවක් උපසම්පදා තත්ත්වයට පත් වූ පසු කෝටියක් සංවර ශීලය ආරක්ෂා කළ යුතු බව බුදුදහම විග්‍රහ කරයි. එසේ වුවත් මනුෂ්‍ය ඝාතනය, සොරකම, ස්ත්‍රී සේවනය ඇතුළු කවර වූ හෝ ලිංගික ක්‍රියාවක නිරත වීම, මෙන්ම තමා ලබා නොමැති මාර්ගඵලයක් ලබා ඇතැයි අන් අයට ප්‍රකාශ කිරීම සතර පාරාජිකාවන් වේ. යම් භික්ෂුවක් මෙකී පාරාජිකාවන් සිදුකර තිබේ නම් එකී භික්ෂුවගේ භික්ෂූත්වය අහෝසි වන බව පොදු පිළිගැනීම යි.

මීට අමතරව සංඝාදිසේසයන් උල්ලංඝනය කිරීම ද ප්‍රධාන ගණයේ විනය උල්ලංඝනය කිරීමක් ලෙස සැළකෙන අතර කෙසේ වුව ද එහි දී චූදිත භික්ෂූන් වහන්සේ සසුනෙන් නෙරපීමක් සිදු නොවන බව මහාචාර්ය කෝ ලේයි ගේ අදහස යි. ඒ අනුව සංඝයා වහන්සේ එක්ව පනවනු ලබන විනය නීතීන්ට යටත් ව නිශ්චිත පරිවාස කාලයක් ගත කිරීම මගින් තම වරද

කමා කර ගැනීම මෙහි දී සිදුවේ. මීට අමතර ව ඉහත දක්වන ලද සෙසු විනය උල්ලංඝනය කිරීම් පෙන්වා දිය හැක්කේ අවැත් දෙසීම තුළින් කමා කරගත හැකි වරදවල් වශයෙනි. එනම් තමා විසින් සිදුකළ වරද තවත් හිමිනමක් වෙත පාපොච්ඡාරණය කර වරද කමා කර ගැනීම යි.

මෙවැනි සුවිශේෂී අවස්ථා සඳහා රටේ සාමාන්‍ය අධිකරණ ක්‍රියාවලිය ඔස්සේ විසඳුම් සෙවීමට වඩා සංඝාධිකරණයක් මගින් වඩාත් ප්‍රායෝගික තීරණයක් ලබා ගත හැකි ය. නමුත් වර්තමාන ශ්‍රී ලංකාව තුළ සංඝාධිකරණයක සංයුතිය සහ නඩු කටයුතු විමර්ශනය කරන ආකාරය පාලනය කෙරෙන නිශ්චිත ව්‍යවස්ථාමය රාමුවක් නොමැති වීම ඊට අහිතකර ලෙස බලපා තිබේ. ඒ අනුව ඒ ඒ නිකාය විසින් තමන්ටම අනන්‍ය වූ රීතීන් සහ කතිකාවත් අනුව සංඝාධිකරණ කැඳවීම සිදු කරන අතර එය නිකාය අනුව වෙනස් වන්නකි. කෙසේ වුව ද යුක්තිය ඉටු කිරීමේ අපෙක්ෂාවෙන් සිදු කරනු ලබන ඕනෑම අධිකරණ ක්‍රියාවලියක් තුළ පොදුවේ අන්තර්ගත විය යුතු රීතීන් පිළිබඳ විග්‍රහයක් නූතන සාමාන්‍ය නීතියේ එන මූලධර්ම සහ බෞද්ධ නීති මූලධර්ම ඇසුරෙන් ගොඩනගා ගත හැකි ය.

භික්ෂු ශාසනය තුළ විනය ගැටලු ඇති වූ කල්හි ඒවා විසඳා ගැනීම පිණිස භාවිත කළ හැකි අධිකරණ ක්‍රම සතරක් පිළිබඳව විනය පිටකයේ චුල්ලවග්ග පාලියේ සමථකඛන්ධකය තුළ දේශනා කර තිබේ.[21] ඒ 'චත්තාරිමානි භික්ඛවේ අධිකරණානි : විවාදාධිකරණං, අනුවාදාධිකරණං, ආපත්තාධිකරණං, කිච්චාධිකරණං'' යනුවෙනි. එම අධිකරණ සතර වනුයේ,

1. විවාදාධිකරණය
2. අනුවාදාධිකරණය
3. ආපත්තාධිකරණය
4. කච්චාධිකරණය යනාදිය යි.

ඒ අනුව භික්ෂු සංඝයා අතර මතුවන වාද විවාද ගැටුම් නිසාවෙන් සිදුවිය හැකි භේදභින්නතාවන් විසඳාලීම

විවාදාධිකරණය තුළින් සිදු කරනු ලබයි. භික්ෂූන්ට එරෙහි ව මතුවන විවිධ චෝදනා විමසා විසඳීම සඳහා අනුවාදාධිකරණය ද, ශීලය පිළිබඳ මතුවන ආපත්තිමය චෝදනා විසඳීමට ආපත්තාධිකරණය ද, සංඝයා විසින් ඉටුකළ යුතු කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා කිච්ඡාධිකරණය ද උපකාරී වේ.22

මීට අමතරව ඉහත අධිකරණයන්හි නඩු කටයුතු විමර්ශනය කිරීම පිණිස ඉවහල් වන ක්‍රමවේදයන් හතරක් භාවිත කරන ලදි.

ඒවා නම් ‍:

**1. සම්මුඛා විනය**

මෙහි දී අදාළ නඩු කටයුත්ත චූදිත, චෝදක දෙපාර්ශ්වය ඉදිරියේ විභාග කොට විනිශ්චයට පැමිණීම සිදු කරයි.

**2. සති විනය**

සති විනය භාවිත කරනු ලබන්නේ රහතන් වහන්සේ කෙනෙකු සම්බන්ධව ඉදිරිපත් වන අභූත චෝදනාවන් විභාග කිරීම පිණිස ය. එහි දී රහතන් වහන්සේ සෑම කල්හිම මනා සතියෙන් වැඩවාසය කරන හෙයින් චෝදනාවෙන් නිදහස් වේ.

**3. අමූල්හ විනය**

අමූල්හ විනය ලෙස හඳුන්වන්නේ කිසියම් භික්ෂූන් වහන්සේ නමක් උමතු තත්ත්වයෙන් සිටි විටක සිදු කරන ලද ක්‍රියාවක සාවද්‍ය හෝ නිරවද්‍යභාවය උන්වහන්සේ ප්‍රකෘති තත්ත්වයට පත් වූ පසු ව විමසා බැලීම යි.

**4. පටිඤ්ඤාතකරණ විනය**

වරදක් සිදුකළ ද එම වරද තමා සිදුකළ බව පිළිගන්නේ නම් සහ එම වරද බරපතල නොවන තැනක දී අවවාද දී නිදහස් කිරීම පටිඤ්ඤාතකරණය යි. එහි දී වරද පාපොච්ඡාණය තුළින් පුනරුත්ථාපනයට අවස්ථාව ලබා දීම පිළිබඳ ව සලකා බලයි.

**5. යේභුය්‍යසිකා විනය**

මෙහි දී සිදුවන්නේ ධර්මවාදී භික්ෂූන්ගේ වැඩි කැමැත්ත පරිදි විවාදාපන්න කරුණු පිළිබඳ ව සමතයකට පැමිණීම යි.

**6. තස්සපාපිය්‍යසිකා විනය**

මෙහි දී පාපීය වූ භික්ෂුවක් කෙරෙහි කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ සමතයකට පැමිණීම සිදුවේ.

**7. තිණවත්ථාරකය**

මෙහි දී ද සිදුවන්නේ ඇවැත් දෙසීමෙන් පිරිසිදු වීම හෙවත් තම වරද කියාපෑම හරහා එතැන් පටන් කිසිදු වරදක් අලුතින් සිදු නොකරන බවට ප්‍රතිඥා දීම යි.

**2.2 අධිකරණමය ක්‍රියාවලියක් මෙහෙයවීමට අදාළ ව නූතනයේ භාවිත වන නීතියේ පොදු මූලධර්ම**

ඉහත සඳහන් කළ තත්ත්වයට සමාන්තර ව නූතන නීති සන්දර්භය තුළ ද අධිකරණමය ක්‍රියාවලියක් මෙහෙයවීමට අදාළව මූලධර්ම රාශියක් පිළිගෙන ඇත. ඉන් ප්‍රධාන වශයෙන් වැදගත් වන මූලධර්ම ත්‍රිත්වයක් කෙටියෙන් විමසා බැලීම වැදගත් වේ. ඒ අනුව සෑම අධිකරණ ක්‍රියාවලියක්මඃ

1. ස්වභාවික යුක්ති මූලධර්මවලට අනුව සිදු කිරීම : (ස්වභාවික යුක්ති මූලධර්මය)
2. දෙපාර්ශ්වයට ම සාධාරණත්වය ඉටුකර තිබීම : (සාධාරණත්වය සහ යුක්තිය)
3. සිදුකළ වරදට සාපේක්ෂ සහ සමානුපාතික මට්ටමින් දඬුවම් නියම කිරීම : (සමානුපාතිකභාවයේ මූලධර්මය) අනුව සිදුවිය යුතු බව නීතියේ පොදු පිළිගැනීම යි.

ස්වභාවික යුක්ති මූලධර්ම යනුවෙන් හැඳින්වෙන්නේ කවර අර්බුදකාරී තත්ත්වයක් යටතේ වුව ද අධිකරණමය ක්‍රියාවලියක දී නොඑසේනම් ඕනෑම තීරණ ගැනීමේ කටයුත්තක දී අනුගමනය කළ යුතු යුක්ති මූලධර්මයන් ය. මෙකී මූලධර්ම අනුගමනය කිරීමේ

ප්‍රධානතම අරමුණ වන්නේ යුක්තිය ඉටුවීම පමණක් නොව එය නිසි පරිදි ඉටු වූ බව සමාජයට පෙනෙන්ට සැලැස්වීම යි. නීතිය තුළ ප්‍රධාන වශයෙන් සළකා බලන ස්වභාවික යුක්ති මූලධර්මයන් ත්‍රිත්වයක් පවතී. ඒවා නම් :

1. තමාගේ නඩුව තමා විසින් නොවිමසිය යුතු බව (Nemo judex in causa sua)
2. දෙපාර්ශ්වයටම සමාන ව ඇහුම්කන් දීම (Audi alteram partem)
3. තීරණයට හේතු දැනගැනීමේ අයිතිය (Right to know the reason)

## 1. තමාගේ නඩුව තමා විසින් නොවිමසිය යුතු බව (Nemo judex in causa sua)

මෙමගින් අදහස් කරන්නේ සිය තීරණය මගින් බලපෑමට ලක්වන කවර පාර්ශ්වයක් වෙත හෝ විනිශ්චයකරුගේ යම් බැඳියාවක් (මීට ඥාතීත්වයක්, මිත්‍රත්වයක් හෝ වෙනත් වාසිදායක හෝ අවාසිදායක බැඳියාවක්)23 පවතී. නමුත් එම බැඳියාව හෙළිදරව් කිරීම හෝ අදාළ විනිසුරුවරයා එම නඩුව විමසීමෙන් ඉවත්වීම යි. එසේ නොකොට අදාළ බැඳියාව සඟවාගෙන හිඳ පසු කලෙක හෙළිදරව් වුවහොත් කලින් ලබාදෙන ලද තීරණය ඉහළ විනිශ්චයක අධිකරණයක් මගින් අවලංගු කරවා ගැනීමේ හැකියාවක් එයින් අසාධාරණයට පත් පාර්ශ්වයන්ට පවතී.[24]

## 2. දෙපාර්ශවයට ම සමාන ව ඇහුම්කන් දීම (Audi alteram partem)

මෙය පක්ෂපාතීත්වයට එරෙහි මූලධර්මය යනුවෙන් ද හඳුන්වනු ලබයි. යම් ආයතනයකට කිසියම් පුද්ගල හෝ ප්‍රතිපත්තිමය කරුණක් සම්බන්ධ ව තීරණ ගැනීමේ වගකීමක් 'අධිකරණමය වගකීමක්' පවරනු ලැබූ විය ඊට අදාළ කර්තව්‍යයන් ඉටුකිරීමේ දී එම තීරණයෙහි බලපෑමට ලක්වන සෑම පාර්ශවයකට ම කිසිදු අගතියක් නොවන අන්දමට කටයුතු කළ යුතුය යන්න මින්

අදහස් වේ. එහි දී යම් කරුණු විමසීමක් 'විනිශ්චය කටයුත්තක්' ඉටු කිරීමට සිදුවේ නම් නඩුවෙහි අදාළ දෙපාර්ශ්වයටම තමා වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීමට සමාන ලෙස අවස්ථාව ලබාදිය යුතු ය. එමෙන් ම අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ යුක්තිය ඉටුවීම පමණක් නොව එසේ ඉටු වූ බව පෙනෙන්නට තිබීම ද වැදගත් වේ.[25]

## 3. තීරණයට හේතු දැනගැනීමේ අයිතිය (Right to know the reason)

යම් විනිශ්චය අධිකරණයක් තීරණයක් ගනු ලබන්නේ තමා වෙත ඉදිරිපත් වන සාක්ෂි පදනම් කරගෙන ය. එසේ ගනුලැබූ තීරණය සඳහා නිශ්චිත හේතුවක් දැක්වීමෙන් තමා වෙත ඉදිරිපත් වූ සියලු ම සාක්ෂි සලකා බැලූ බවත්, කිසිම පාර්ශ්වයකට අසාධාරණයක් සිදු නොකළ බවත් ජනතාවට ඒත්තු ගැන්වීමට හැකි වේ. ඒ අනුව අධිකරණයට නීතිය මගින් මග පෙන්වීම් නිකුත් කර තිබුණ ද නොතිබුණ ද ලබා දෙන සෑම තීරණයක් ම හේතු සහිත වේ' යන්න නීතියේ අපේක්ෂාව යි.[26]

## 4. දෙපාර්ශ්වයටම සාධාරණත්වය ඉටුකර තිබීම

යම් නඩුවක තීරණය නීතියේ සඳහන් විධිවිධාන අනුවම ලබා දුන් විට ඒ තුළින් යුක්තිය ඉටු නොවේයැ'යි අධිකරණයට හැඟී යන අවස්ථාවන්හි දී සාධාරණත්වයේ මූලධර්ම අදාළ කරගනු ලබයි. පළමුව, පවතින නීතියෙහි අඩු ලුහුඬුකම් සොයා බැලීමත්, එවන් අඩුලුහුඬුතාවන් පවතී නම් එය නිවැරදි කර අදාළ නඩුවට යොදා ගැනීමත් සිදු කරනු ලබයි. මෙහි දී සලකා බලන්නේ අදාළ සිදුවීමේ දී වරදකරුගේ හැසිරීම කොතරම් නීත්‍යනුකූල ද යන්න නොව, එය කොතරම් සාධාරණ වී ද යන්න යි. උදාහරණයක් ලෙස හදිසි රෝගියෙකු රෝහල්ගත කිරීම පිණිස රැගෙන යන අවස්ථාවක දී අධික වේගයෙන් රිය පැදවීම යන වරදට කෙනෙකු වරදකරු වූ අවස්ථාවක ඔහුව සුළු දඩ මුදලකට යටත් කිරීම පෙන්වා දිය හැකි ය.

### 5. සිදුකළ වරදට සාපේක්ෂ සහ සමානුපාතික මට්ටමින් දඬුවම් නියම කිරීම

නීතිය තුළ මෙය 'සමානුපාතිකත්වයේ මූලධර්මය' යනුවෙන් ද හඳුන්වනු ලබයි. මෙහි දී සිදු කෙරෙන්නේ අදාළ දඬුවම නියම කිරීම තුළින් නීතිය අපේක්ෂා කළ අරමුණ ඉටුවේ ද යන්න විමසා බැලීම යි.[27] සරල ව විග්‍රහ කරන්නේ නම්, වරදට අසමානුපාතික දඬුවමක් ලබා දීම යනු රටකජු ඇටයක් තැලීම පිණිස කුළුගෙ ඩියක් යොදා ගැනීම. Use a sledgehammer to crack a nut. හා සමාන ය. එහි දී ලැබෙන එක ම ප්‍රතිඵලය වන්නෙ රටකජු ඇටය කිසිඳු ප්‍රයෝජනයකට ගත නොහැකි අන්දමින් විනාශයට පත්වීම යි. යම් අධිකරණමය තීරණයක් ගැනීම තුළින් සිදුවන යහපත සහ ඒ සඳහා සමාජයට දැරීමට සිදුවන පිරිවැය ඒ අනුව මෙහි දී තුලනය කරනු ලැබේ.

### 3. වරින්වර ශ්‍රී ලංකාවේ සිවිල් (ගිහි) අධිකරණ විසින් සංඝාධිකරණවලට අදාළ කටයුතු අර්ථනිරූපණය කර ඇති ආකාරය

සංඝාධිකරණවල විභාග වූ නඩු සිවිල් අධිකරණ මගින් ප්‍රතිනිරීක්ෂණයට ලක්කිරීම බ්‍රිතාන්‍ය පාලන යුගයේ දී ආරම්භ විය. කෙසේ වුව ද සිය නිරීක්ෂණ මත පදනම් වෙමින් ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා පෙන්වා දෙන්නේ ලබ්දිය අතින් කිතුනුවන් වූව ද ඉංග්‍රීසි විනිශචයකාරවරුන් බුදු සසුන සම්බන්ධ නඩු තීරණ ලබා දීමේ දී හැකි තාක් පිටක සම්ප්‍රදායට අනුකූල වීමට උත්සහ කර ඇති බව යි. එක් එක් වකවානුවල දී අප අධිකරණය බුදු සසුන සම්බන්ධව අනුගමනය කළ ප්‍රවේශය පදනම් කර ගනිමින් ආචාර්ය වීරසූරිය විසින් 1796 සිට අද දක්වා කාල සීමාව යුග පහකට බෙදා දක්වයි. ඒ අනුව,

1. වසර 1796 සිට 1832 දක්වා වූ යුගය
2. වසර 1833 සිට 1889 දී විහාර හා දේවාලගම් පනත පැනවීම දක්වා වූ යුගය

3. වසර 1889 සිට 1925 අතර වැදගත් අධිකරණ තීරණ රැසක් ලබාදුන් යුගය
4. වසර 1925 සිට 1948 දී බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබා ගැනීමට පෙර යුගය

**1. වසර 1796 සිට 1832 දක්වා වූ යුගය**

බ්‍රිතාන්‍යයන් විසින් වසර 1801 දී පනවන ලද යුක්ති සන්නස මඟින් මෙරට ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටුවනු ලැබී ය. එතැන් පටන් විශේෂයෙන් ම වසර 1815 දී උඩරට රාජධානිය ද ඉංග්‍රීසීන්ට යටත් වූ පසු මහානායක හිමිවරුන්ගේ ඉල්ලීම් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වෙත යොමු කිරීම ඉංග්‍රීසි සිවිල් සේවකයන් අතින් සිදු විය. පෝල් පිරිස් විසින් තම Ceylon and her Patriots[28] යන ග්‍රන්ථය තුළ උපුටා දක්වන සිදුවීම් පෙළක් මෙහි දී සලකා බැලීම වැදගත් වේ. ඒ අනුව වසර 1817 දී නාවිමන උන්නාන්සේ විසින් ඉංග්‍රීසි අධිකරණ නිලධාරීන් ඉදිරියේ කරතොට උන්නාන්සේ වෙනුවෙන් පෙනී සිටිමින් කරතොට ශිෂ්‍ය පරම්පරාවට රාජකීය සන්නස් පත්‍රයක් මඟින් පවරා දෙන ලද පල්ලේබැද්ද විහාරය එය බලහත්කාරයෙන් අත් කරගෙන සිටින පිරිසකගෙන් නිදහස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි. එසේම වසර 1816 දී මහගොඩ ඉන්ද්‍රසාර හිමියන් ඉල්ලා සිටියේ පුරාණ රජ සිරිත අනුව යමින් හේවිසිකරුවන් සහ කොඩිකරුවන් සේවයේ යෙදවීමට අවසර දෙන ලෙස ය.

මෙම යුගයට අදාළව ඉතා වැදගත් අධිකරණ තීරණ යුගලයක් ලෙස 1827 දී විනිශ්චිත දන්තුරේ උන්නාන්සේ සම්බන්ධ සිදුවීම සහ 1832 දී තීරණය කරන ලද එරමින්නේ උන්නාන්සේ සම්බන්ධ සිදුවීම පෙන්වා දිය හැකි ය. මෙහි දී දන්තුරේ උන්නාන්සේ සම්බන්ධ නඩුව විභාග වන 1827 වර්ෂය වන විට ශ්‍රේෂ්ඨාධිකරණයට උඩරට ප්‍රදේශ සම්බන්ධ අධිකරණ බලය නොවී ය. එහෙත් එරමින්නේ උන්නාන්සේ සම්බන්ධ නඩුව වසර 1833 දී විභාග කර අවසන්වන විට කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ හරහා ශ්‍රේෂ්ඨාධිකරණයට උඩරට ප්‍රදේශ සම්බන්ධ අධිකරණ බලය ලබා දී තිබිණි. ඒ අනුව එම නඩුව තීරණය වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයක් වශයෙනි.

**2. වසර 1833 සිට 1889 දී විහාර හා දේවාලගම් පනත පැනවීම දක්වා වූ යුගය**

මේ යුගයේ දී විභාග වූ නඩු තීරණ දෙකක් ඇසුරෙන් බුදු සසුන සම්බන්ධ අර්බුදවල දී ඉංග්‍රීසි අධිකරණය සිදු කළ මැදිහත් වීම සම්බන්ධව මනා වැටහීමක් ලබාගත හැකි ය. මින් පළමුවැන්න වන්නේ වසර 1838 දී මහනුවර දිසා අධිකරණය ලබා දුන් නඩු තීරණය යි.[29] රඹුක්වැල්ලේ උන්නාන්සේ සුදුහුම්පල විහාරයේ විහාරාධිපති ධූරය හෙබවූ අතර පසුව සියම් නිකායෙන් ඉවත් ව අමරපුර නිකායට ඇතුල් වූහ. මුලින් සාමාජිකත්වය දැරූ නිකායෙන් ඉවත් වීම යන පදනම මත එවක බ්‍රිතාන්‍ය රජය විසින් රඹුක්වැල්ලේ උන්නාන්සේ විහාරාධිපති ධූරයෙන් ඉවත් කර ඒ වෙනුවට වාරිපල උන්නාන්සේ අදාළ තනතුරට පත් කරන ලදි. කෙසේ වුව ද රඹුක්වැල්ලේ උන්නාන්සේගේ ශිෂ්‍ය පරපුර අමරපුර නිකාය නියෝජනය කරමින් විහාරාධිපති ධූරයේ හිමිකාරීත්වය ඉල්ලා සිටි අතර මහනුවර දිසා අධිකරණය කියා සිටියේ සුදුහුම්පල විහාරයේ විහාරාධිපති ධූරය අමරපුර නිකායට හිමි විය යුතු බව යි. කෙසේ වූව ද එකී තීරණය ප්‍රතික්ෂේප කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය කියා සිටියේ අදාළ විහාරාධිපති ධූරය හිමිවිය යුත්තේ සියම් නිකායට බව යි. මෙහි දී ශ්‍රේෂ්ඨාධිකරණය මූලික ප්‍රශ්න දෙකක් සැලකිල්ලට ගන්නා ලදී. එනම් :

1. රඹුක්වැල්ලේ උන්නාන්සේ අපවත් වීමෙන් පුරප්පාඩු වූ විහාරාධිපති ධූරයට එම හිමියන්ගේ ශිෂ්‍ය පරපුරට අයත් නොවන අස්ගිරි පාර්ශ්වයේ හිමිනමක් පත් කිරීමට රජයට බලතල පවතී ද?
2. රඹුක්වැල්ලේ උන්නාන්සේගේ ශිෂ්‍ය පරපුරෙන් පැවතුණ ද අමරපුර නිකායට අයත් ස්වාමීන් වහන්සේට ඉහත කී විහාරාධිපති ධූරයට හිමිකමක් පවතී ද? යනුවෙනි.

මීළඟට වැදගත් වන නඩු තීරණය වන්නේ ශ්‍රී පාදස්ථානාධිපති ධූරය සම්බන්ධයෙන් වර්ෂ 1867 දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීරණය යි. සිරිත් පරිදි පවත්වන ලද ඡන්ද විමසීමකින් අනතුරුව

අත්තදස්සී හිමියන් ශ්‍රී පාදස්ථානයේ විහාරාධිපති ධූරය සඳහා මල්වතු පාර්ශ්වය විසින් තෝරා පත්කර ගන්නා ලදි. ඉන් ඉක්බිති ව වසර 1860 අප්‍රේල් 4 වන දින එවක ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වූ සර් හෙන්රි වෙට්ගේ අත්සනින් යුක්තව අක්‍ෂපත්‍ර බාර දෙනු ලැබී ය. වසර 6ක ඇවෑමෙන් එනම්, 1866 දී මල්වතු පාර්ශ්වය විසින් අත්තදස්සී හිමියන් එම ධූරයෙන් ඉවත් කරලු ලැබූ අතර ඒ සඳහා හේතු ලෙස දක්වන ලද්දේ,

1. නොමනා ක්‍රියාකාරීත්වය
2. විහාරාධිපති ධූරය දැරීමට ප්‍රමාණවත් ශක්නුතාවයක් නොමැති වීම සහ
3. විහාර දේපළ අවභාවිත කිරීම යි

ඒ අනුව අදාළ තනතුරට මල්වතු පාර්ශ්වය විසින් හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් පත්කළ නමුදු අත්තදස්සී හිමියන් ධූරයෙන් ඉවත් වීම ප්‍රතික්ශේප කරන ලදි. ඉන් ඉක්බිති ව මල්වතු පාර්ශ්වයට එරෙහි ව අත්තදස්සී හිමියන් විසින් අධිකරණ ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර දීර්ඝ නඩු විභාගයකින් පසු රත්නපුර දිසා අධිකරණය ප්‍රකාශ කළේ අත්තදස්සී හිමියන් අදාළ ධූරයෙන් නෙරපීමට මල්වතු පාර්ශ්ව සංඝසභාව විසින් ගනු ලැබූ තීරණය නීත්‍යානුකූල නොවන බව යි.[30]

ඉහත දිසා අධිකරණ තීරණයට එරෙහි ව හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනා කිරීමෙන් අනතුරුව ක්‍රීසි අගවිනිසුරු තුමා සහ ටෙම්පල් සහ ලෝසන් යන විනිසුරුවරුන්ගෙන් සමන්විත පූර්ණ අධිකණයක් ඉදිරියේ එය විභාගයට ගන්නා ලදි.[31] එහි දී මුල් අධිකරණ තීරණය ප්‍රතික්ෂේප කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කර සිටියේ අත්තදස්සී හිමියන් ශ්‍රී පාදස්ථාන විහාරාධිපති ධූරයෙන් ඉවත් කිරීමට මල්වතු පාර්ශ්ව සංඝසභාව විසින් ගනු ලැබූ තීරණය නීත්‍යානුකූල බව යි.

ඒ අනුව, අත්තදස්සී හිමියන් ඉවත් කිරීම සම්බන්ධව කතිකා කිරීම සඳහා කැඳවන ලද සංඝාධිකරණය හිමිවරුන් පස් දෙනෙකුට වැඩි සංඛ්‍යාවකගෙන් සමන්විත විය. තමාට එරෙහි චෝදනාවන්ට පිළිතුරු දීම පිණිස ධර්මශාලාවට හෙවත්

පොහොය ගෙය වෙත සපැමිණෙන ලෙසට අත්තදස්සී හිමියන්ට ආරාධනා කළ ද එහිමියන් ඊට සහභාගී වීම හිතාමතාම ප්‍රතික්ෂේප කර තිබුණි. එසේම අත්තදස්සී හිමියන් තම තනතුරේ වරප්‍රසාද අනිසි අයුරින් භාවිත කර ඇති බවත්, විහාරස්ථාන අරමුදල් තම පුද්ගලික අරමුණු පිණිස යෙදවීම මගින් අයතා ලෙස ධනවත් වී ඇති බවත් අනාවරණය වී තිබිණි. ඒ අනුව අත්තදස්සී හිමියන් ඉවත් කිරීම සහ අදාළ තනතුරට හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් පත් කිරීමට මල්වතු පාර්ශවය විසින් ගනු ලැබූ තීරණය නීතියේ සියලුම මූලධර්ම හා එකඟ වන බව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විය.

### 3. වසර 1889 සිට 1925 අතර වැදගත් අධිකරණ තීරණ රැසක් ලබාදුන් යුගය

ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා මෙම යුගය හඳුන්වන්නේ පුනරුද යුගය වශයෙනි. එයිනුත් වසර 1910 සිට 1925 දක්වා යුගය නීතියේ සංවර්ධනාත්මක යුගය ලෙස හඳුන්වනු ලබයි. වසර 1910 දී විභාග වූ ප්‍රකට අධිකරණ තීරණයක් වන ධර්මරතන උන්නාන්සේ එදිරි ව සුමංගල උන්නාන්සේ නඩුව මෙහි දී වැදගත් වේ.[32] මෙය මහනුවර දිසා අධිකරණය හරහා ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා වූවකි. ශිෂ්‍යභාවය, ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා අයිතිය, ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව බිඳවැටුණු විට සිදු වන්නේ කුමක් ද යනාදිය එහි දී සාකච්ඡාවට බඳුන් වූ කරුණු අතර විය. මෙහි දී මිඩ්ල්ටන් සහ වුඩ්රෙන්ටන් යන විනිසුරුවරුන් බෞද්ධ ශාසනික නීතිය සම්බන්ධව විශාරධත්වයට පැමිණ සිටි මල්වතු පාර්ශවීය හිමිවරුන් 7 දෙනෙකුගේ විශේෂඥ අදහස් ලබාගන්නා ලදි.

බෞද්ධ ශාසනික ගැටලුවක් අධිකරණය ඉදිරිපිටට පැමිණි විට සලකා බලන්නේ කවර කරුණු ද යන්න සරණනංකර උන්නාන්සේ එදිරිව ඉන්ද්‍රජෝති උන්නාන්සේ තීරණයේ දී තෝමස් ඩි සම්පායෝ විනිසුරුතුමා පැහැදිලි කරුනු ලැබී ය. ඒ අනුව එවන් අවස්ථාවන් හි දී බෞද්ධපාඨ ග්‍රන්ථවල සඳහන් කරුණුවලට වඩා නීතියෙන් පැවත එන චාරිත්‍රවලට සහ සැබෑ පරිචයන් විදහා දැක්වෙන සාක්ෂි කෙරෙහි ප්‍රමුඛත්වය හිමිවන බව

ගරු අධිකරණයේ මතය විය.33 එමෙන්ම සුමංගල උන්නාන්සේ එදිරි ව සෝභිත උන්නාන්සේ හි දී ඩයස් විනිසුරුතුමා කියා සිටියේ භික්ෂූත්වයට අදාළවන නීති රැසක් ත්‍රිපිටකය තුළ දක්නට ලැබුණ ද අප අධිකරණය එකී සියලුම නීතීන් අනුග මණය නොකරණ බවයි.[34] ඒ අනුව අප අධිකරණය අනුගමනය කරන්නේ ශ්‍රී ලංකාව තුළ අනුගමනය කරනු ලැබූ ශාසනික නීති පමණි. මේ තත්ත්වය වඩාත් විශධ වූ අධිකරණ තීරණ යුගලයක් ලෙස රත්නපාල උන්නාන්සේ එදිරිව අබ්දුල් කාදර්[35] සහ මහත්තයා එදිරි ව කුමාරිහාමි[36] යන නඩු තීරණ දැක්විය හැකි ය. එහි දී අප අධිකරණය කියා සිටියේ බුදුදහම තුළ සියලු දේපළ අත්හැරීම යන්න අනුදැන වදාළ ද ලාංකේය චාරිත්‍රානුකූල නීතිය තුළ යම් පුද්ගලික දේපළ ප්‍රමාණයක් දැරීමට භික්ෂූන් වහන්සේට අවසර ඇති බව යි. මීට සමාන මතයක් පසු කලෙක විභාග වූ ගල්කිරියාගම සෝරත තෙර එදිරිව පල්ලේගම හේමරතන (අටමස්ථාන නඩු තීරණය) හි දී ප්‍රකාශයට පත් විය. එහි දී ප්‍රශ්නගත වූයේ අටමස්ථානාධිපති ධූරයට හිමිවරුන් පත්වීමේ දී ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව පිළිබඳ රීතිය කෙලෙසින් අදාළ වන්නේ ද යන්න යි. එහි දී ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය ලබා දෙමින් පංච පුද්ගල විනිසුරු මඩුල්ල ප්‍රකාශ කර සිටියේ අටමස්ථානාධිපති ධූරය සඳහා භික්ෂූන් වහන්සේ නමක් තෝරා ගැනීමේ දී ගිහි පැවිදි දෙපාර්ශ්වයේම නියෝජනය සහිත අටමස්ථාන කමිටුව විසින් ගනු ලබන තීරණයට වැදගත් තැනක් හිමි වන බවයි.[37] ඒ අනුව මෙම කටයුතු බුද්ධකාලීන නීති මගින් පාලනය නොවන නිසාත්, ඊට කාලාන්තරයක් තිස්සේ ගොඩනැගී ඇති සම්ප්‍රදායන් තීරණාත්මක ලෙස බලපා ඇති නිසාත් එකී සිරිත් විරිත්වලට ප්‍රමුඛත්වය හිමිවන බව අධිකරණයේ මතය විය.

### 4. වසර 1925 සිට 1948 දී බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබා ගැනීමට පෙර යුගය

මෙම යුගයේ දී ඉංග්‍රීසි අධිකරණය ත්‍රිවිධ නිකායන්ට අයත් සංඝාධිකරණ විසින් ලබා දුන් තීරණවලට ඉතා ප්‍රවේශමෙන් මැදිහත් වන සෙයක් දක්නට ලැබිණි. මෙකී තත්ත්වයට මාවත

සැකසූ අධිකරණ තීරණයක් ලෙස නුකු ලෙබ්බේ එදිරිව තම්බි තීරණය පෙන්වා දිය හැකි ය.[38] එහි දී ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කර සිටියේ ශාසනික අධිකරණ විසින් සාධාරණ නඩු විභාගයක් පවත්වා නැති බවට පැහැදිලිව දක්නට ලැබෙන අවස්ථාවන්හි දී පමණක් ඊට මැදිහත් වීමට සිවිල් (ගිහි) අධිකරණය අපේක්ෂා කරන බව යි. එමෙන්ම අත්තදස්සී උන්නාන්සේ එදිරිව රේවත උන්නාන්සේ හි දී අප ශ්‍රේෂ්ඨාධිකරණය ආගමික පර්ශද ඇතුළු ඕනෑම අධිකරණමය ක්‍රියාමාර්ගයකින් අසාධාරණයට පත් අයෙකුට අභියාචනය කිරීමේ පූර්ණ අයිතිය පිළිගන්නා නමුත් තමාට සිදු වූ අසාධාරණය පැමිණිලිකරු විසින්ම ඔප්පු කළ යුතු බව පෙන්වා දෙනු ලැබී ය.[39] මේ තත්ත්වය තව දුරටත් පැහැදිලි කරමින් කිරිකිත්තේ සරණංකර තෙර එදිරිව ධම්මානන්ද තෙර හි දී ප්‍රකාශ වූයේ යම් අයුතු ක්‍රියාවක් හෝ නඩුවට අදාළ හරයාත්මක කරුණුවල යම් දෝෂයක් හෝ ස්වභාවික යුක්ති මූලධර්ම උල්ලංඝනය කිරීමක් සිදු වී නැතැයි පැහැදිලිවම දක්නට ලැබේ නම් තමා ස්ව කැමැත්තෙන්ම පාර්ශ්වයක් බවට පත් වූ අධිකරණයක අවසන් තීරණය පිළිගැනීමට ඕනෑම තැනැත්තෙකු බැඳී සිටින බව යි.[40] ඒ අනුව නිසි ව්‍යවස්ථාපිත නීතියක් ඔස්සේ සංඝාධිකරණවල අධිකරණ බලය පිළිගනු නොලැබුණ ද රටේ අධිකරණ ධූරාවලිය තුළ ඊට හිමිව තිබූ වටිනාකම මෙම යුගය තුළ පුළුල් වන බව දක්නට නොලැබෙන්නකි.

## 5. බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබා ගැනීමේ සිට වර්තමානය දක්වා වූ යුගය

වසර 1948 දී බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස දිනාගැනීමෙන් පසු අද දක්වා ශ්‍රී ලංකාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ත්‍රිත්වයක් යටතේ පාලනය වී තිබේ. මින් පළමුවැන්න වූ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29 (2) ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවේ නීති සෑදීමේ බලයට තීරණාත්මක ලෙස සීමාවන් පනවනු ලැබී ය.[41] කෙසේ වුව ද 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකා ජනරජය බුදුදහමට ප්‍රමුඛත්වය ලබා දෙන බව සහ බුදුදහම ආරක්ෂා කර පෝෂණය කිරීමේ වගකීම

රාජ්‍යය සතු බව පිළිගනී. ඉන් වසර 6ක් වැනි කෙටි කාලයක් තුළ මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පුළුල් වෙනසකට ලක් වූව ද 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්නට ලැබුණු එක් සුවිශේෂී ලක්ෂණයක් වූයේ පළමු ජනරජ ව්‍යවස්ථාව තුළ අන්තර්ගත ව පැවති බුද්ධාගම පිළිබඳ පරිච්ඡේදය එහි 9 වන ව්‍යවස්ථාව වශයෙන් එලෙසම එක් කර තිබීම යි.

මෙම ප්‍රතිපාදනය ඇතුළත් කිරීම හරහා කණ්ඩායම් කිහිපයක් ආමන්ත්‍රණය කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය අපේක්ෂා කරනු ලැබී ය. මින් පළමු කණ්ඩායම නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බුදුදහමට ප්‍රමුඛත්වය හිමි විය යුතු බවට හඬ නැගූ පිරිස යි. එසේ ම සුළුතර ආගමිකයන්ට සමාන රැකවරණය තහවුරු කිරීම ද මෙම දෙපාර්ශවය අතර සංහිඳියාවක් ගොඩනැගීම ද මෙහි අරමුණු අතර විය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට බුදුදහම පිළිබඳ වගන්තිය ඇතුළත් කිරීමේ ප්‍රතිඵල කිහිපයක් අපට මූලික වශයෙන් හඳුනාගත හැකි ය. තම ආගමික අයිතිවාසිකම් ඉල්ලා සිටීමට අවශ්‍ය කරන ව්‍යවස්ථාමය පදනමක් බෞද්ධයන් හට හිමි වීම මෙහි ආසන්නතම ප්‍රතිඵලය බවට පත් විය. ප්‍රමුඛතා අනුපිළිවෙළට පෙළගැස්වුණු ආගම් ධූරාවලියක් නිර්මාණය වීම, බුදු සසුන හා ඉහළ දේශපාලනය අතර සමීප සම්බන්ධතාව තහවුරු වීමෙන්ම නව නඩු තීන්දු සම්ප්‍රදායක ආරම්භය ද මේ හා බැඳුණු ආනුශංගික ප්‍රතිඵලයන් ය.

ඒ අනුව මෙම ලිපියෙහි පළමු හා දෙවන පරිච්ඡේදයන්හි සාකච්ඡා කළ අභිමතාර්ථයන්ගෙන් ඔබ්බට යමින් රාජ්‍ය ක්‍රියාකාරකම් වෙතින් බුදු සසුන ආරක්ෂා කර ගැනීමට මෙන්ම විවිධ මතවාදයන් අතර ඇතිවන ගැටුම්වලදී බුදු සසුනට අධිකරණමය ආරක්ෂාවක් ලබා ගැනීම[42] පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙවලමක් ලෙස උපයෝගී කර ගැනීම නූතනයේ දක්නට ලැබෙන්නකි. තව ද දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නඩු තීරණය[43] මෙන්ම අම්පාර ප්‍රදේශයේ පුරාවස්තු සඳහා රාජ්‍ය ආරක්ෂාව ලබා දෙන මෙන් පූජ්‍ය එල්ලාවල මේධානන්ද තෙර විසින් පවරන ලද නඩු තීරණය[44] ද අපට

පෙන්වා දෙන්නේ බුදුදහමට අන්‍යාගමිකයන්ගෙන් සිදු වේ යැයි උපකල්පිත අනතුරුවලට එරෙහිව මෙන්ම බෞද්ධ බිම් ප්‍රදේශ ආරක්ෂා කිරීමේ මෙවලමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන ව්‍යවස්ථාව උපයෝගී කරගැනෙන තත්ත්වයක් නිර්මාණය වී ඇති බව යි.

මෙරට බුදු සසුන සම්බන්ධයෙන් අලුත්ම අධිකරණ තීන්දු සම්ප්‍රදායක් ගොඩනැගෙන තත්ත්වයක් අතරතුර පූජ්‍ය කෙසෙල්වතුගොඩ චන්දානන්ද තෙර එදිරිව පූජ්‍ය සිරිමල්වත්තේ ආනන්ද තෙර නඩුවේ දී රණරාජා විනිසුරුතුමා විසින් ලබා දුන් තීරණය වැදගත් වේ.[45] එහි දී පෙත්සම්කරු තම ශිෂ්‍ය පදවියෙන් නෙරපා හරිමින් නායක හිමිවරුන් දෙනම ඔහුගේ අයුතු හැසිරීම් හේතුකොට ගෙන තම ශිෂ්‍යයෙකු ලෙස තවදුරටත් තබාගත නොහැකි බවට මල්වතු පාර්ශ්වයට වාර්තා කරන ලදි. එකී තීරණයට මල්වතු සංඝසභාවේ අනුමැතිය හිමි විය. කෙසේ වුව ද ඉහත තීරණය අභියෝගයට ලක් කරමින් අදාළ ශිෂ්‍ය හිමිනම අභියාචනාධිකරණය ඉදිරියේ රිට් පෙත්සමක් ගොනු කළ අතර එහි දී රණරාජා විනිසුරුතුමා කියා සිටියේ භික්ෂු විනය සම්බන්ධව සංඝසභාවක් විසිනු ගනු ලබන තීරණය අවසානාත්මක වන බව යි. එසේම බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාට අදාළ හිමිනමගේ තොරතුරු ලේඛනයෙන් ඉවත් කරන ලෙසට මහනායක හිමියන් විසින් ඉල්ලා යැවූ පසු, නැවතත් අදාළ හිමිනම ශිෂ්‍ය තනතුරේ පිහිටුවන ලෙසට නියම කිරීම මහනායක තනතුරට සිදු කරන අගෞරවයක් වන බව ද විනිසුරුතුමන්ගේ මතය විය.

## 4. නූතනයේ කරලියට පැමිණ තිබෙන 'ථෙරවාද භික්ෂු කතිකාවත් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත' ආශ්‍රිත ව ගොඩනැගී ඇති නව ප්‍රවණතා

බුදු සසුනේ ක්‍රියාකාරීත්වයට අදාළව ව්‍යවස්ථා සහ අනපනත් පැනවීම සම්බන්ධයෙන් මෑත කාලීනව පුළුල් සාකච්ඡාවක් ගොඩනැගුණු අවස්ථාවක් ලෙස ථෙරවාද භික්ෂු කතිකාවත් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත[46] සම්බන්ධ සාකච්ඡාව පෙන්වා දිය හැකි ය. මෙම පනත් කෙටුම්පත සම්බන්ධව ඉදිරිපත්

වූ එක් මතවාදයක් වූයේ කතිකාවත් නීතිය උල්ලංඝනය කරන භික්ෂූන් වහන්සේට දඬුවම් නියම කිරීමට නිකායික කාරක සංඝ සභාවට බලතල ලබා දීම තුළ වර්තමානයේ පැන නැගී ඇති ශාසනික ගැටලු බොහොමයකට මේ තුළින් විසඳුම් ලබා ගත හැකි වනු ඇති බවයි.[47] කෙසේ වුවද සෙසු සන්ධර්භයට අදාළව ගොඩනැගුණු අනෙක් මතවාදය වූයේ යෝජිත පනත් කෙටුම්පත මගින් භික්ෂූන් වහන්සේගේ ස්වාධීත්වයට තර්ජන එල්ල වන බවයි.[48] ඒ අනුව ඉහත මතවාදයන්හි සත්‍ය අසත්‍යතාව අවබෝධ කර ගැනීම පිණිස මෙම පනත් කෙටුම්පත ගැඹුරින් විශ්ලේෂණය කිරීම මෙහිදී වැදගත් වේ.

පනත් කෙටුම්පතේ පූර්විකාව දක්වා සිටින්නේ එක් එක් නිකායවල කතිකාවත් සම්පාදනයට සහ ලියාපදිංචි කිරීමට අදාළ විධිවිධාන දැක්වීමටත්, කතිකාවත්වලට නෛතික වලංගුභාවය ලබා දීමටත්, එම කතිකාවත් උල්ලංඝනය කරන භික්ෂූන් වහන්සේට දඬුවම් නියම කිරීමටත් පනත තුළින් අරමුණු කරන බව යි.

එක් එක් නිකායන්ට තම අභ්‍යන්තර කටයුතු පිණිස කතිකාවත් පැනවීමේ දී අදාළ වන සීමාවන් මොනවා ද යන්න එහි 2(1) වගන්තිය තුළින් පෙන්වා දෙයි. ඒ අනුව,

(අ) කාරක සංඝසභාවේ සංයුතිය හා කාර්යයන්

(ආ) අනුගමනය කළ යුතු විනය නීති මාලා

(ඇ) එම විනය උල්ලංඝනය කළ භික්ෂූන්ට එරෙහි විමර්ශන පවත්වන ආකාරය සහ

(ඈ) ලබා දෙන දඬුවම් ආදිය ඊට අයත් වේ.

මීට අමතර ව ඉහත 2(1) වගන්තිය මගින් පනවන විනය රීතීන් හරහා භික්ෂූන් වහන්සේට අකැප විය යුතු කරුණු සම්බන්ධව යම් කරුණු දැක්වීමක් පනතේ 3 වන වගන්තිය මගින් සිදුකර යි. ඒ අනුව එකී විනය නීතීන්ටඃ

(අ) අභිචාර විධි හෝ එවැනි වෙනත් පරිඡයන් සිදු කිරීම

(ආ) වෙළඳ හෝ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම

(ඇ) රියදුරු බලපත්‍ර ලබා ගැනීම හෝ වාහන ධාවනය කිරීම

(ඈ) අධ්‍යාපන අංශය හැර වෙනත් රජයේ හෝ පුද්ගලික අංශයේ රැකියාවල නිරත වීම

(ඊ) වෙනත් එවැනි විනය විරෝධී ක්‍රියා ආදිය අයත් වේ.

එසේ ම පනතේ 4 වන වගන්තිය එවැනි අවස්ථාවක ලබා දිය හැකි දඬුවම් මොනවා ද යන්න දක්ව යි.

(අ) දැනට වැඩ සිටින පන්සලෙන් තාවකාලික ව ඉවත් කිරීම

(ආ) දැනට වැඩ සිටින පන්සලෙන් ස්ථිර ලෙස ඉවත් කිරීම

(ඇ) විහාරාධිපති ධූරයෙන් තාවකාලික ව ඉවත් කිරීම

(ඈ) විහාරාධිපත් ධූරයෙන් ස්ථිර ලෙස ඉවත් කිරීම

(ඉ) ශිෂ්‍යභාවයෙන් ඉවත් කිරීම

(ඊ) භික්ෂූත්වය අවලංගු කිරීම යනු ඒවා ය.

යම් නිකායක් විසින් කතිකාවතක් නීත්‍යනුකූළ ලෙස සම්පාදනය කරන්නේ කෙසේ ද? යන්න පනතෙහි 4 වන වගන්තිය මගින් විග්‍රහ කරයි. ඒ අනුව පනතේ දෙවන වගන්තිය මගින් දක්වා ඇති උපමානයන්ට යටත් ව කතිකාවතක් සම්පාදනය කිරීමෙන් පසු, අදාළ කතිකාවත නිකායික සංඝ කාරකසභාව විසින් නිසි පරිදි සම්පාදනය කළ බවට මහානායක හිමියන්ගේ අත්සන සහිත ව නිකුත් කරන ලද අයදුම්පතක් සමඟ එය ලියාපදිංචි කිරීම පිණිස බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාට යොමු කළ යුතු ය. එවිට අදාළ කතිකාවතෙහි නීත්‍යනුකූලභාවය විමසා බැලීම පිණිස බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා විසින් එය පනතේ 5 වන වගන්තිය යටතේ ස්ථාපිත කමිටුවක් වෙත යොමු කරනු ලබයි. අදාළ විද්වත් කමිටුව බුද්ධ ශාසන අමාත්‍යවරයා විසින් ත්‍රෛයි නිකායික මහානායක හිමිවරුන්ගේ උපදේශකත්වයෙන් පත්කරනු ලබන අතර ඊට භික්ෂූන් වහන්සේ දෙනමක් සහ බෞද්ධ විනය නීති පිළිබඳ දැනුමක් සහිත නීතිඥවරුන් දෙදෙනෙක් අයත් වේ. යම් කතිකාවතක් මෙම කමිටුවට ඉදිරිපත් වූ විට ඔවුන් මූලික කරුණු දෙකක් විමසනු ලබයි. එනම්,

1. අදාළ කතිකාවත පවතින නීතියේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරන්නේ ද? යන්න
2. එම කතිකාවත සම්පාදනය කිරීම තුළින් බෞද්ධ විනය නීති හෝ චාරිත්‍ර කිසිවක් උල්ලංඝනය වන්නේ ද? යන්න යි.

තම නිරීක්ෂණයන් අනුව අදාළ කතිකාවත ඉහත කරුණු හා නොගැළපෙන්නේ නම් ඒ බව බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා වෙත දැනුම් දෙනු ලබයි. කොමසාරිස්වරයා විසින් එකී තීරණය අදාළ නිකායෙහි ලේඛකාධිකාරී ස්වාමින්වහන්සේ වෙත යොමු කරන අතර කතිකාවත නිසි පරිදි ලියාපදිංචි කිරීම පිණිස ඊට කාරක සංඝ සභාවෙහි අනුමැතියෙන් සංශෝධන සිදු කරවා ගැනීමෙන් අනතුරුව නැවත වරක් එය විද්වත් කමිටුවේ නිරීක්ෂණයට භාජනය කරයි. ඉන්පසු ව අදාළ කතිකාවත නිසි පරිදි සම්පාදනය වී තිබේ නම් 'කතිකාවත නිසි පරිදි සම්පාදනය වූ බවට වන සහතිකය' බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා වෙත යොමු කරනු ලබයි. ඉන් ඉක්බිති ව කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරන ලද කතිකාවතේ පිටපතක් අදාළ නිකායෙහි මහානායක හිමියන් වෙත පෞද්ගලිකවත්, එම නිකායෙහි ලේඛකාධිකාරී ස්වාමින්වහන්සේ වෙත ලියාපදිංචි තැපෑලෙනුත් යොමු කළ යුතු ය.[49]

කතිකාවත් සංශෝධනය කිරීමට අදාළ නීති තත්ත්වය පනත් කෙටුම්පතේ 7 වගන්තිය මගින් විග්‍රහ කරයි. ඒ අනුව යම් නිකායක කාරක සංඝ සභාව විසින් කතිකාවතක් සඳහා සංශෝධන ඉදිරිපත් කළ හැකි අතර එහි දී ද පනත් කෙටුම්පතේ ඉහත 3 සහ 4 වගන්ති මගින් විග්‍රහ කර ඇති කාර්යය පටිපාටිය අනුගමනය කළ යුතු ය. එසේ සම්පාදිත සියලු ම කතිකාවත් සම්බන්ධ ලේඛනයක් බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.[50]

මෙසේ සම්පාදනය කෙරෙන කතිකාවත් භික්ෂූන් වහන්සේට බලපාන්නේ කෙසේ ද යන්න පනත් කෙටුම්පතේ 9 වන වගන්තිය තුළින් විග්‍රහ කරයි. ඒ අනුව එක් එක් නිකාය විසින්

පනවන කතිකාවත් මගින් ඒ ඒ නිකායට අයත් භික්ෂූන් වහන්සේ දැඩි ලෙස බන්ධනයට ලක්වන අතර ඊට අනුව සිය ශාසනික සහ පෞද්ගලික කටයුතු පවත්වාගෙන යා යුතු ය.

යම් භික්ෂූන් වහන්සේ නමක් තම නිකාය මගින් පනවා ඇති කතිකාවත් හා අනුගතව කටයුතු නොකරන්නේ නම් එම භික්ෂූන් වහන්සේට එරෙහිව නෛතික පියවර ගැනීමට නිකායික කාරක සංඝසභාවට පනත් කෙටුම්පතේ 10 (1) වගන්තිය තුළින් බලය පවරා තිබේ. එහි දී චූදිත භික්ෂූන් වහන්සේ විසින් තම නිදහස පිණිස ඉදිරිපත් කරන කරුණු සඳහා ඇහුම්කන් දීමට කාරක සංඝසභාව කටයුතු කළ යුතු ය.[51] චෝදනා විභාගය අවසානයේ චූදිත භික්ෂූන් වහන්සේ වෙත අත්පිට වශයෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතුය.[52]

ඉහත පරිදි කාරක සංඝසභාව විසින් නිකුත් කරන කවර නියෝගයක් වුව ද පිළිපැදීමට කටයුතු නොකරන හෝ ප්‍රතික්ෂේප කරන භික්ෂූන් වහන්සේ නමක් වුව ද පනත් කෙටුම්පත යටතේ වරදකරුවෙකු වන අතර[53] එවන් අවස්ථාවක මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ කෙරෙන නඩු විභාගයකින් අනතුරු ව රුපියල් 50000කට නොවැඩි දඩයක් හෝ 6 මසක කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකින් හෝ ඒ දෙකෙන් ම දඬුවම් කළ යුතු ය.[54]

ඉහතින් විග්‍රහ කරන ලද පනත් කෙටුම්පතේ නීත්‍යානුකූලභාවය අභියෝගයට ලක්කරමින් පිවිතුරු හෙළ උරුමය පක්ෂයේ ශාසනික ලේකම් පූජ්‍ය බියගම සුසීල තෙර විසින් ගොනු කරනු ලදු ව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ විභාග වූ ''ථේරවාද භික්ෂු කතිකාවත් පනත් කෙටුම්පත් නඩු තීරණය'' විමසා බැලීම ඉතා වැදගත් වේ.[55] සිය පෙත්සම මගින් පෙත්සම්කාර හිමියන් කියා සිටියේ මෙකී පනත් කෙටුම්පත මගින් භික්ෂූන් වහන්සේට දඬුවම් නියම කිරීමට රජය ඍජු ලෙස ම මැදිහත් වීම සදාචාරාත්මක නොවන බව යි. එමෙන් ම භික්ෂු විනය පරීක්ෂණයන්හි සහ කතිකාවත්වල රහස්‍යභාවය ද මේ ඔස්සේ අනාවරණය වීමට ලක්වන බව පෙත්සම්කාර හිමියන්ගේ මතය විය. තව ද පෙත්සම්කාර හිමියන් පැවසුවේ පනතේ 2, 3, 4, 5,

6, 7, 8, 9, 10, 11, 12, 13, 14, 15 සහ 16 යන වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4(ඇ) සහ (ඈ), 9, 10, 11, 12(1), 12(2), 14(1)(ආ), 14(1)(ඉ), 27 සහ 28 යන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කරන බව යි.

එසේ ම මෙම පනත් කෙටුම්පත් මගින් ථෙරවාද සම්ප්‍රදායට අයත් භික්ෂූන් සඳහා පමණක් නීති පනවන බව පෙන්වා දෙනු ලැබී ය. ඒ තුළින් මහායාන සම්ප්‍රදායට අයත් භික්ෂූන් වහන්සේලාට සහ ක්‍රිස්තියානි මෙන් ම කතෝලික ප්‍රජාවන්ට සාපේක්ෂ ව ථෙරවාද භික්ෂූන් වහන්සේ නීතිය ඉදිරියේ වෙනස්කොට සැලකීමකට භාජනය කෙරෙන බවත් එතුළින් ථෙරවාද භික්ෂූන් වහන්සේලාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන බවත් පෙත්සම්කාර හිමියන් තවදුරටත් පෙන්වා දෙන ලදි. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය ද ප්‍රකාශ කර සිටියේ පනත් කෙටුම්පත මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වන අතර එය සම්මත කිරීමට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර එකඟතාවය සහ ජනමත විචාරණයක දී මහජනතාවගෙන් බහුතර කැමැත්ත අවශ්‍ය වන බව ය.

**සමාප්තිය**

භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිස බුදු සසුනේ කටයුතු පවත්වාගෙන යන අතරතුර විවිධ කරුණු අරබයා එක් එක් පාර්ශ්වයන් අතර අර්බුද පැන නැගිය හැකි බවත්, ඒවා නිරාකරණය පිණිස අවශ්‍ය ධර්මානුකූල උපදෙස් රාශියක් ත්‍රිපිටකය තුළ අන්තර්ගත වන බවත් දක්නට ලැබෙන්නකි. කෙසේ වුව ද සංඝාධිකරණ සම්බන්ධව අප ශ්‍රේෂ්ඨාධිකරණය වරින් වර ලබා දී ඇති විවිධ නඩු තීන්දු අධ්‍යයනයේ දී පොදුවේ එළඹිය හැකි නිගමනයක් වන්නේ සෑම නිකායකටම අයත් සංඝාධිකරණයක්ම පාහේ සිය අධිකරණමය ක්‍රියාවලිය ඒකාකාරී සහ ක්‍රමවත් ස්වභාවයකින් පවත්වාගෙන යාමට අසමත් ව ඇති බව යි. මීට ප්‍රධානත ම හේතුව ලෙසට සංඝාධිකරණ කටයුතු නියාමනය කෙරෙන නිශ්චිත ව්‍යවස්ථාවක නොපැවතීම පෙන්වා දිය හැකි ය. කෙසේ නමුත් ඉහත හිස්තැන පිරවීමේ අදහසින් වසර 2015 දී ථෙරවාද භික්ෂු කතිකාවත් පනත් කෙටුම්පත ගෙන එනු ලැබූව

ද සමස්තයක් ලෙස එයට බෞද්ධ සමාජය තුළ සැලිකය යුතු විරෝධයක් එල්ල විය. තව ද එහි ඇතැම් ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන බවත් එනිසාම පනත්කෙටුම්පත සංශෝධනය කිරීමට හෝ නැත්නම් පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සහ ජනමත විචාරණයකින් අනුමත විය යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කිරීමත් සමග ඊට අදාළ ක්‍රියාවලිය නතරවනු දක්නට ලැබිණි. කෙසේ නමුත් සංඝාධිකරණ කටයුතු නියාමනය කෙරෙන ව්‍යවස්ථාවක අවශ්‍යතාව මෙහි දී එයින් ම බැහැර නොවන බව අප විසින් වටහා ගැනීම වැදගත් වේ. ඒ අනුව සිදුවිය යුත්තේ භික්ෂු සමාජයේ කටයුතුවලට සහ එහි ගෞරවයට හානි නොවන පරිදි සංඝාධිකරණ ක්‍රියාවලිය නියාමනය කිරීම යි. ඒ සඳහා රාජ්‍යය කොතරම් දුරට මැදිහත් විය යුතු ද යන්න ද මෙහි දී නිශ්චය කර ගැනීම අතිශය වැදගත් වේ.

## ආන්තික සටහන්

1. කතෘ මණ්ඩලයක් විසින් සම්පාදිතය *භික්ෂු ප්‍රාතිමෝක්ෂය සහ විනය කරුණු,* කිතුල්ගොඩ ආරණ්‍ය සේනාසනය කිතුල්ගොඩ අගලවත්ත 2017, පෙබරවාරි ප්‍රවේෂය. www.sadaham.net/.../005-BIKSHU -PRATIMOKSHAYA-VINAYA-...Result options, ප්‍රවේෂ වූ දිනය 2019 පෙබරවාරි මස 28 වන දින.
2. *එම*-40 පිටුව
3. *එම*-
4. *එම*-
5. Ko Lay, *A Guide to Tipitaka*, 1991,Buruma Pitaka Association Yangon,Myanmar, P5-8 "ප්‍රවේශය www.myanmarnet/nibbana/ tipintro.htmResult options, , ප්‍රවේශ වූ දිනය 2019 පෙබරවාරි මස 28 වන දින
6. *එම*-පිටුව 9
7. බෙන්ජමින් ස්කොන්තල් සහ අසංග වැලිකල , බුදු දහම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ආගම නියාමනය කිරීම, පැවති විවාදයන් වර්තමාන අභියෝග සහ අනාගත අවස්ථාවන්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍ර කාර්යය පත්‍රිකා අංක 3-2016 ජූලි මස, ප්‍රවේශය. https://www. cpalanka.org/.../Buddhism-and-the-regulation-of-religion-in-the-new-con...Result options ප්‍රවේශ වූ දිනය 2019 මාර්තු මස 12 වන දින.

8. මෙම ග්‍රන්ථය වසර 1765-1785 අතර ශ්‍රී ලංකාවේ වෙරළබඩ පළාත් පාලනය කළ ලන්දේසි ආණ්ඩුකාරවරයා වූ විල්හෙල්ම් ෆල්ක් වෙත මෙරට චාරිත්‍රානුකූල නීතිය සම්බන්ධ විශාරදත්වයට පත්ව සිටි මල්වතු පාර්ශවයේ හිමිවරුන් විසින් සිදු කළ පැහැදිලි කිරීම ඇසුරින් ලේඛනාරූඪ වී තිබේ.
9. ආචාර්ය වික්‍රම වීරසූරිය, *බෞද්ධ ශාසනික නීතිය*, සරසවි ප්‍රකාශකයෝ නොම්බර 30 ස්ටැන්ලි තිලකරත්න මාවත නුගේගොඩ (2011), පිටුව 29.
10. Tambiah H W, An account of Buddhism under the Sinhalese king ,Ceylon branch of the royal Asiatic society (CBRAS) journal,1962
11. කතෘ අඥාතය, *ශාසන චිරස්තිය සඳහා ඇති කළ කතිකාවත්*, ඉරිදා දිවයින 2005-02-20. http://www.divaina.com/2005/02/20/scholast01.html ප්‍රවේශය 2018-11-18
12. (2) මහා පරාක්‍රමබාහු කතිකාවත (1) කීර්ති ශ්‍රී නිශ්ශංක මල්ල කතිකාවත (3) වත්හිමි විජයබාහු කතිකාවත (4) දඹදෙණි කතිකාවත (5) ගම්පොළ බුවනෙකබාහු කතිකාවත (6) දැතිගම වික්‍රමබාහු කතිකාවත (7) වීරබාහු කතිකාවත (8) හය වන පරාක්‍රමබාහු කතිකාවත (9) කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත (10) රාජාධිරාජසිංව කතිකාවත මේ කතිකාවත් අතරට අයත් වේ.
13. එම-
14. ගුණසිංහ, හසිත චාමිකර, *සියම් උපසම්පදාව ලක්දිව පිහිටුවීම*, සමාජීය විද්‍යා පීඨය කැළණිය විශ්වවිද්‍යාලය, (2015) ප්‍රවේශය, repository.kln.ac.lk/handle/1-3456789/13617 result options ප්‍රවේශ වූ දිනයඃ 2019 මාර්තු 12
15. ජයතිලක, ඩී.බී., *කතිකාවත් සහ සගරු*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2002, පිටු 27-71
16. එම- 9 වන පාදක සටහන බලන්න.
17. නිදසුනක් ලෙස බලන්න, රජිණ එදිරිව බුද්ධරඛිත තෙර (එස් ඩබ් ආර් ඩී බණ්ඩාරණායක ඝාතන නඩුව ) 63 නව නීති වාර්තා 433.
18. මීට අදාළව කරුණු විමසීමේදී මහනුවර දිස්ත්‍රික් අධිකරණ නඩු අංක 8950 සහ අභියාචනය විමසමින් 1838 දෙසැම්බර් මස 28 වන දින ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීරණය වැසගත් වේ. එහිදී අධිකරණය කියා සිටියේ යම් හිමි නමක් විහාරාධිපති ධූරයෙන් ඉවත් කිරීමට ගනු ලබන තීරණයක නීත්‍යානුකූබාවය පරික්ෂා කිරීමට අධිකරණයට අධිකරණමය බලය ඇති බවය.
19. මොරොන්තුඩුවේ තෙර එදිරිව කොඩයාවේ පඤ්ඤාසේකර තෙර (1973) 76 නබඝ 196 බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සිලය මෙම නඩුවේ අවසන් අභියාචනාධිකරණ තීරණය ලබා දීමේදී ඉංග්‍රීසි නීති මූලධර්ම මත පදනම් වූ අතර, එහිදී විහාරාධිපති ධූරය පිරිනැමීම සම්බන්ධව ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරා අනුප්‍රාප්තිය මූලධර්මය නොසලකා හරින ලදි.

20. පූජ්‍ය ධර්මවේදි නාලන්දේ විමලවංශ හිමි, භික්ෂුත්වයට බලපාන සතර පාරාජිකා (දිනපතා දිවයින 31 ජූලි 2018 ) ප්‍රවේශය www.divaina.com/images/bud31july/bud19-htmlResult options ප්‍රවේෂ වූ දිනය 2019 මාර්තු මස 12 වන දින.
21. බෞද්ධ අධිකරණ, දිනමිණ ^2009-11-04archives.dinamina.lk/2009/11/04_art.asp.?fn=a0911044Resultoptions ප්‍රවේශය 2018-11-18.
22. පූජ්‍ය තිස්සමහාරාමේ ඉන්ද්‍රසාර හිමි, බුදු සමයෙන් අනාවරණය වන අපරාධ විද්‍යාත්මක සාධක (දිවයින) 2012-04-10 www.divaina.com/images/bud10april/bud.12htmlResult options ප්‍රවේෂය 2018-11-18.
23. Metropolitan Properties ( H.G.C.LTD ) v Lanon (1969) 1 Q B 577
24. Dimes v Properitors of Grand Junction Cannel (exparte Holand )(1852) 3 HL Cas 759 (1852) EngR 789 නඩු තීරණයෙන් පසුව අනාවරණය වූයේ එය විනිශ්චය කරන ලද බ්‍රිතාන්‍ය චැන්සරි අධිකරණයේ විනිසුරුවරයා නඩුවේ පාර්ශ්වකාර සමාගමක කොටස් හිමියෙකු බවයි. ඒ අනුව මූල්‍ය පක්ෂපාතිත්වය මත එම තීරණය නිශ්ප්‍රභා කොට වෙනත් විනිසුරුවරයෙකු ඉදිරියේ නඩුව යළි කැඳවන ලදී.
25. Local government Board v Arlidge (1915) A.C. 120
26. Karawita v Abeyrathne 2 Sri L.R. 306
27. Swoter W.POMFR, Propotionality Analysis and Model;s of Judicial Review (16-06-2013) European Law Blog .https://europeanlawblog.eu/tag/principle-of-propotinalityResult options ප්‍රවේෂය, Accessed: 2018-11-24
28. Pier is P, Ceylon and her patriots,New Delhi: Navrang, 1995.
29. මහනුවර දිසා අධිකරණ නඩු අංක 8950
30. රත්නපුර දිසා අධිකරණ නඩු අංක (9353) 1869
31. වැන්ඩස්ට්‍රාටන් නඩු වාර්තා (1969-1871)
32. ධර්මරත්න උන්නාන්සේ එදිරිව සුමංගල උන්නාන්සේ (1910) 14 නව නීති වාර්තා 400
33. සරනන්කර උන්නානසේ එදිරිව ඉන්දුජෝති උන්නානසේ (1918) 20 නව නීති වාර්තා 385
34. සුමංගල උන්නාන්සේ එදිරිව ශෝභිත උන්නාන්සේ 3 SCC 253
35. රත්නපාල උන්නාන්සේ එදිරිව අබ්දුල් කාදර් 5 SCC 61
36. මහත්තයා එදිරිව කුමාරිහාමි 7 SCC 84
37. Weerasuriya W, Excellent New Text on Historic “Atamasthanaya” Litigation ( the Island, 07-07-2012),www.island.lk/index.php?page_cat=article-details…title…Result options, ප්‍රවේෂය 28-11-2018

38. නුකු ලෙබ්බේ එදිරිව තම්බි (1913) 16 NLR 94
39. අත්තදස්සී උන්නාන්සේ එදිරිව රේවත උන්නාන්සේ (1928) 29 නව නීතී වාර්තා 361
40. කිරිකිත්තේ සරනන්කර තෙර එදිරිව දම්මානන්ද තෙර (1954) 55 නව නීති වාර්තා 313
41. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29(2) ව්‍යවස්ථාව මෙසේ දක්වා සිටී. (අ) යම් ආගමක් ඇදහීම සීමා කරන පනත් (ආ) යම් ආගමක් අදහන්නන් බාධාවකට හෝ වාරණයකට ලක් කරන පනත්, (ඇ) යම් ආගමක් අදහන්නන් හට සුවිශේෂි වරප්‍රසාද ලබා දෙන පනත්, (ඈ) යම් ආගමක පාලනයට අදාළ නීතියක් එම ආගමට අයත් පාලන අධිකාරියේ අවසරයකින් තොරව වෙනස් කිරීම සිදුකළ නොහැක.
42. නීතිඥ වෘත්තියට හිමි නමක් ඇතුළත් කර ගැනීම පිළිබදව ශ්‍රේෂ්ඨාධිකරණ තිරණය(1978) 2005 3 NLR 370
43. ඒක පාර්ශ්වික දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත් නඩු තීරණය (1987) 2 SLR 333
44. පූජ්‍ය එල්ලාවල මේධානන්ද තෙර එදිරිව සුනිල් කන්නන්ගර සහ තවත් wh SC (FR) 178-2008
45. කෙසෙල් වතුගොඩ චන්දානන්ද තෙර එදිරිව සිරිමල්වත්තේ ආනන්ද මහා නායක තෙර (1997) 2 Sri L R 287
46. ථෙරවාදී භික්ෂු කතිකාවත් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් අංක 60 වසර 2015 දෙසැම්බර් මස 14 වන දින රජයේ ගැසට් පත්‍රයේ පල කර බුද්ධ ශාසන අමාත්‍යවරයා විසින් වසර 2019 ජනවාරි මස 12 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.
47. Staff writer .Most Ven Summangala Thero states key points on Theravadi Bhikku Kathikawath Bill (25 2016 ckjdrs ui 25 වන දින) ප්‍රවේශය https://www.newsfirst.lk/most-ven-summangala-thero-states-key-points-on-theravadi...Result options, ප්‍රවේශ වූ දිනය 2019 මැයි මස 29 වන දින.
48. Kirinde S,Bhikku Vinaya a la Sri Lanka, under threat from new code-of-conduct Bill:PHU, (Sunday times,24 January 2016) m%fõIh www.sundaytimes.lk/.../bhikku-vinaya-a-la-sri-lanka-under-threat-from-new-code-of-...Result options, ප්‍රවේශ වූ දිනය 2019 මැයි මස 29 වන දින.
49. 46 වන පාද සටහන 6 වන වගන්තිය
50. එම 8 වන වගන්තිය
51. එම 10 (2) වන වගන්තිය
52. එම 10 (3) වන වගන්තිය

53. එම 11 (1) වන වගන්තිය
54. එම 11 (2) වන වගන්තිය
55. ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ ශේෂ්ඨාධිකරණ තීරණය 01/2016 02/2016 සහ 07/2016